# 17 සතුරන්ටත් ප්‍රේම කරමු



17.2 රූපය - කුරුසයේ ජීවිතය පූජා කළ ජේසුස් වහන්සේ

මෙම ගීතිකාව ගායනා කරන්න.

**පුන ගැයුම :**

පෙම් කරන්න එකිනෙකාට - සුහද සොයුරු ප්‍රේමයෙන්
දිවි ගෙවන්න එකමුතු වී - සමිඳුන් තුළ සාමයෙන්

1. ඔබට වඩා අනුන් උතුම් කොට නිරතුරු සලකන්න
   උඩඟු නොවී අසල්වැසියනට බුහුමන් දක්වන්න
   අලස නොවී සිතට දිරිය ගෙන කටයුතු සපුරන්න
   සමිඳු කෙරේ බැතිය පෙරටු කොට සේවය සලසන්න

2. සැපතෙහි දී සිතෙන් උදම් නොව සතුටට පත්වන්න
   විපතෙහි දී නොපසුබටව තව ඉවසිලිමත් වන්න
   උදය හවා දෙවිඳු යැදුම නම් අතපසු නොකරන්න
   අසරණයන් පිහිට පතන විට පිළිසරණය වන්න

3. දුක් පීඩා කරන අය කෙරේ සාමය පතුරන්න
ඔබට පවා වරද කරන විට නපුරක් නොකරන්න
සතුටු සිනා රැළි නැගෙනා විට ඔබ ද සිනාසෙන්න
දුකට වැටී අනුන් පෙළෙන විට සැබැවින් දුක්වන්න
(කිතුනු ගී 214)

ඉහත ගීතිකාවෙන් ඔබේ ජීවිතයට එකතු කර ගත යුතු ගුණාංග මෙන් ම ඔබේ ජීවිතයෙන් ඉවත් කරගත යුතු දුර්ගුණ වෙන වෙන ම ලැයිස්තු ගත කරන්න.

එම කරුණු අතර ඔබට දුක්පීඩා කරන, එසේත් නැත්නම් සතුරුකම් කරන අයට පවා සමාව දීම අවශ්‍ය බව එයින් කියැවේ. සතුරන්ට සමාව දීම පිළිබඳ ව ශුද්ධ ලියැවිල්ලේ සඳහන් කරුණු ගැන විමසා බලමු.

'ඇසට ඇස ය, දතට දතය' යන කීම ඔබ අසා ඇත. එහෙත්, මම ඔබට කියමි, එදිරිකාරයාට විරුද්ධ ව එකට එක නොකරන්න. යමෙකු ඔබේ දකුණු කම්මුලට ගැසුවොත්, ඔහුට අනික් කම්මුල ද හරවන්න. යමෙකු නඩු කියා ඔබේ කමිසය ගන්න කැමති වූවොත්, ඔහුට ඔබේ කබායත් ගන්න අවසර දෙන්න. හේවා නිළධාරියකු තම බඩු පොදිය එක කිලෝමීටරයක් දුර උසුලාගෙන යන්න ඔබට බල කළොත්, ඔහු සමඟ එය කිලෝමීටර් දෙකක් උසුලාගෙන යන්න. ඉල්ලන්නාට දෙන්න; ඔබෙන් ණයට ගන්න කැමති අයට පිටු නොපාන්න.
(මතෙව් 5:38-41)

අපට ප්‍රේම කරන අයට ප්‍රේම කරන්නට අපට අපහසු නැත. එහෙත් අපට හිරිහැර කරන, සතුරුකම් කරන අයට ප්‍රේම කිරීම එතරම් පහසු නැත. එහෙත් අපට සතුරුකම් කරන අයටත් සමාව දිය යුතු බව ඉහත ශුද්ධ ලියැවිලි පාඨයෙන් අපට පෙන්වා දෙයි. සතුරුකම් කරන අයට එකට එක නොකළ යුතු බව පැහැදිලිව ම ප්‍රකාශ කරයි.

දෙවි පියාණන් වහන්සේගේ ආශිර්වාදය, කරුණාව හා දයාව සැම කෙනකුට ම එක හා සමානව ලැබේ. ඔවුන් වහන්සේ අප සැමට ප්‍රේම කරන සේක. එසේ ම අපත් අපගේ සතුරන්ට ප්‍රේම කළ යුතු බව ජේසුස් වහන්සේ ඉතා ම පැහැදිලි ව උගන්වා ඇත.

නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න, සතුරාට වෛර කරන්නැ'යි කී බව ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි, ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න, ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න. මෙසේ ඔබ ස්වර්ගයෙහි වැඩ සිටින ඔබේ පියාණන් වහන්සේගේ පුත්‍රයෝ වන්නහු ය. කුමක් නිසා ද ඔවුන් වහන්සේ දුදනන් හට හා සුදනන් හට තම හිරු එළිය උදා කරවන සේක. දැමිටුවන් හට හා අදැමිටුන් හට වැසි වස්වන සේක. ඔබට ප්‍රේම කරන්නන්ට පමණක් ඔබ ප්‍රේම කරන්නහු නම්, එයින් ඇති විපාකය කුමක් ද? අයකැමියෝ පවා එසේ නොකර ද? ඔබේ සහෝදරයන්ට පමණක් ඔබ ආචාර කරන්නහු නම්, එහි ඇති විශේෂය කුමක් ද? විජාතිකයෝ පවා එසේ නොකරත් ද? එබැවින් ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ සර්ව සම්පූර්ණ ව සිටින්නාක් මෙන් ඔබ ද සර්ව සම්පූර්ණ වන්න.

(මතෙව් 5:43-48)

ඉහත ඉගැන්වීම් අනුව අපට පීඩා කරන සතුරකුට වුවත් අප හදවතින් ම ප්‍රේම කළ යුතු බව පැහැදිලි ය. දෙවි පියාණන් වහන්සේ සුදනන් හා දුදනන් හට එක හා සමානව ප්‍රේමය දක්වන සේක. දෙවි පියාණන් වහන්සේ මෙන් ම අපත් මිතුරන්ට හා සතුරන්ට ප්‍රේම කළ යුතු ය.

සතුරන්ට ප්‍රේම කිරීම අපහසු දෙයකි. එහෙත් තමන්ට මුළු ජීවිත කාලය පුරා ම නින්දා අපහාස කර, අවසානයේ විවිධ බොරු චෝදනා මගින් තමන් ව මරණයට පත් කළ අයට පවා, ජේසුස් වහන්සේ සමාව දුන් සේක.

ජේසුස් වහන්සේ කතා කොට, "පියාණෙනි, ඔවුන්ට කමා වුව මැනව, ඔවුන් කරන දෙය ඔව්හු නොදනිති" යි වදාළ සේක.

මේ වදන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ අවස්ථාව ඔබට මතක ද? දරාගත නොහැකි වේදනාවෙන් කුරුසියේ එල්ලී සිටින මොහොතක්. ජේසුස් වහන්සේගේ මුළු ශරීරය ම එක ම වණ කැළැල් ගොඩක්. නින්දා සහගත මරණයකට පත් වී ඇති අවස්ථාවක්. ඔවුන් වහන්සේට උසුළු විසුළු කරමින් ජය පැන් බොන සතුරන්ට මේ අවස්ථාවේ දී ජේසුස් වහන්සේ මුළු හදවතින් ම සමාව දෙනවා. උතුම් වූ ප්‍රේමය ලොවට ප්‍රකාශ කරන උතුම් මොහොතක් බවට ඒ අවස්ථාව පත්වෙනවා.

ජේසුස් වහන්සේ සතුරන්ට ප්‍රේම කළ ආකාරයට සතුරන්ට ප්‍රේම කළ අය කිහිප දෙනකු පිළිබඳ ව විමසා බලමු.

## ශුද්ධ වූ ස්තේපන් තුමා

ජේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු වූ ශුද්ධ වූ ස්තේපන් තුමා සතුරන්ට ප්‍රේම කළ ආකාරය ඔබ අසා තිබෙනවා ද? ශුද්ධ ලියැවිල්ලේ ඒ ගැන සඳහන් වේ. (ක්‍රියා 7:54-60). ශුද්ධ වූ ස්තේපන් තුමා දෙවි පියාණන් වහන්සේගේ සත්‍ය වූ ධර්මය ලොවට කියා දෙන්නට ඉදිරිපත් වූ අයෙකි. ඒ නිසා ම ඔහුට බොහෝ පීඩාවලට මුහුණ දෙන්නට සිදු විය.




17.3 රූපය - ශු. ස්තේපන් තුමාට ගල්ගසා මරා දැමීම

ජේසුස් ස්වාමින් වහන්ස, මාගේ ආත්මය පිළිගත මැනව'යි කියා ස්තේපන් යාච්ඤා කරද්දී ඔව්හු ඔහුට ගල් ගැසූහ. ඔහු දණින් වැටී, "ස්වාමින් වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව' යි මහත් හඬින් මොර ගසා කී ය. මෙසේ කියා ඔහු සැතපුණේ ය.

(ක්‍රියා 7:59-60)

## ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු මුනිතුමා

තමන් ව මරණයට පත් කරන්නට උත්සාහ කළ සාහසිකයාට ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා ද සමාව දුන්නේ ය. එතුමන් මරා දමන්නට උත්සාහ කළේ, අලි අග්කා නමැති අයෙකි. අවසානයේ ඔහුගේ උත්සාහය අසාර්ථක වී උන්වහන්සේගේ ජීවිතය බේරුණි. එහෙත් අලි අග්කා සිරභාරයට නියම විය. අලි අග්කා බැලීමට සිර ගෙදරට ගිය ශුද්ධෝත්තම පියතුමා ඔහු ව ආදරයෙන් වැළඳ ගත්තේ ය. ඔහුට එතුමා මුළු හදවතින් ම සමාව දුන්නේ ය.



17.4 රූපය - ශු. දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා අලි අග්කාට සමාව දෙයි

ජේසුස් වහන්සේ පෙන්වා දුන් මග යමින් සතුරාට ප්‍රේම කළ යුතු ආකාරය ශු. දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා මුළු ලොවට ම පෙන්වා දුන්නේ ය. ඔබත් එලෙස ඔබේ සතුරන්ට සමාව දීමට අදිටන් කරගන්න. ඔබට සතුරුකම් කරන අයට සමාව දීම තුළින් ඔබත් දෙව් පියාණන්ට ප්‍රසන්න දරුවකු වීමට උත්සාහ කරන්න.

ජේසුස් වහන්සේ සතුරන්ට සමාව ලබා දීම තුළින් දුන් ආදර්ශය නිතර සිහිපත් කරන්න. සමාව දීම තුළ ප්‍රේමයෙන් පිරුණු අළුත් ජීවිතයකට පා තබන ඔබ සැබැවින් ම වාසනාවන්ත දරුවකු වනු ඇත.

**ක්‍රියාකාරකම**

(1) නිවැරදි වචන තෝරා හිස්තැන් පුරවන්න.

(සතුරන්ට, හිරු එළිය, යාච්ඤා, දෙන්න, එකට එක, කමා වුව)

1. එදිරිකාරයාට විරුද්ධ ව ................. නොකරන්න.
2. ඔබෙන් ඉල්ලන්නාට ..................
3. ඔබට පීඩා කරන්නන් උදෙසා ............ කරන්න.
4. දෙවියන්වහන්සේ දුදනන් හට හා සුදනන් හට තම ............ උදාකරවන සේක.
5. ඔබේ ...................... ප්‍රේම කරන්න.
6. පියාණෙනි ඔවුන්ට ........................ මැනව.

(2) ඔබට සතුරුකම් කරන අයට දෙවි පියාණන් වහන්සේගේ ආශිර්වාදය ලැබෙන ලෙසත් එවැනි අයට තම වැරදි මාර්ගවලින් ඉවත් වීමට අවශ්‍ය ශුද්ධාත්ම බලය ලැබෙන ලෙසත් ඉල්ලා කෙටි යැදුමක් ලියන්න.



***ජීවිතයට බිඳක්***

***ඔබේ මිතුරන්ටත් සතුරන්ටත් දෙවි පියාණන්ගේ ආශිර්වාදය පතා දිනපතා ඔබේ යැදුම්වල දී යාච්ඤා කරන්න.***